# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 30 දරන ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 අගෝස්තු මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 30 දරන ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 58/71.

**ශ්‍රී ලංකා පලතුරු මණ්ඩලය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, පලතුරු කර්මාන්තයේ සම්බන්ධීකරණය සහ පලතුරු කර්මාන්තයේ නිෂ්පාදන සැදීම, අලෙවි කිරීම හා අපනයනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

**1.** මේ පනත ශ්‍රී ලංකා ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 30 දරන ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත යනුවෙන් හැඳින්වෙන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුත්තේ ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා පලතුරු මණ්ඩලය පිහිටුවීම

**ශ්‍රී ලංකා පලතුරු මණ්ඩලය පිහිටුවීම.**

**2.** මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකා පලතුරු මණ්ඩලය යැයි කියනු ලබන හා හඳුන්වනු ලබන මණ්ඩලයක් මේ පනතේ විධිවිධානවලට අනුකූල ව පිහිටුවනු ලැබේ.

**මණ්ඩලය සංස්ථාවක් විය යුතු බව.**

**3.** (1) මණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වේ. සංස්ථාගත නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරිය හැකිය. සංස්ථාගත නාමයෙන් සංස්ථාවට විරුද්ධ ව නඩු පැවරිය හැකිය.

(2) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට, දැරීමට, බදු ගැනීමට හෝ බදු දීමට, උකස් කිරීමට හෝ කුලියට දීමට හෝ විකිණීමට හෝ අන් ලෙසකින් බැහැර කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

**මණ්ඩලයේ සාමාජිකයෝ.**

**4.** (1) පහත සඳහන් සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත වේ :—

(අ) (i) අලෙවි සංවර්ධන කොමසාරිස් ; සහ

(ii) සමුපකාර සංවර්ධන කොමසාරිස්

යන නිල බලයෙන් පත් වන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ආ) පහත සඳහන් පරිදි නම් කරනු ලබන, නම් කළ සාමාජිකයන් පස් දෙනෙක් :—

(i) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ii) ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

ජේ 22023–9,907 (73/7)

(iii) කෘෂි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන එක් සාමාජික යෙක් ;

(iv) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන එක් සාමාජික යෙක් ;

(v) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ අමාත්‍යාංශයේ නිලධරයන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක්.

(2) යම් තැනැත්තෙක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයෙක් නම් ; හෝ

(ආ) මණ්ඩලය විසින් හෝ එය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ කෙළින් ම හෝ අන් අයුරකින් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන තැනැත්තකුගේ මාර්ගයෙන් යම් අයිතිවාසි කමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) සාමාජිකයකු වශයෙන් තම කාර්යයන් ඉටු කිරීම කෙරෙහි හානිකර අන්දමින් බල පෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්,

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ තව දුරටත් සාමාජිකයකු වශයෙන් සිටීමට ඔහු නුසුදුසු වන්නේය.

(3) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු මිය ගිය හෝ ධුරයෙන් අස් වූ හෝ ඉවත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ උපවගන්තියේ ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා යම් සුදුසු තැනැත්තකු නම් කළ හැකිය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නම් කරනු ලැබූ යම් සාමාජිකයකු කලින් අස් වුවහොත් හෝ මිය යෑමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් අත් හැරියහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ නො ගෙවී ඇති කොටස තුළ ධුරය දැරිය යුතුය.

(4) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නාම් කරනු ලැබූ සාමාජිකයකු තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා යම් තැනැත්තකු පත් කළ හැකිය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**5.** (1) 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු මිය යැමෙන්, අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත් හැරියහොත් මිස, අවුරුදු තුනක කාලයක් එකී සෑම සාමාජිකයකු ම ධුරය දැරිය යුතුය.

(2) තමා සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ යම් තනතුරක් ප්‍රකාර ද, ඒ තනතුර තමා විසින් දරනු ලබන තාක් නිල බලයෙන් පත් වන සෑම සාමාජිකයකු ම ධුරය දැරිය යුතුය.

සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**6.** (1) 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවශ්‍යතාවෝචිත බව අමාත්‍යවරයා සලකන්නේ නම්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් එසේ කළ හැකිය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා, ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින තම ධුරය අත් හැරිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසි ම අධිකරණයක දී ප්‍රශ්න නො කළ යුතුය.

සාමාජිකයන් අස් වීම.

**7.** නිල බලයෙන් පත් වූ සාමාජිකයකු නොවන සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් යම් අවස්ථාවක තම ධුරයෙන් අස් විය හැකිය.

සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමේ සුදුසුකම.

**8.** 6 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයකු නොවන, ධුරය අත් හැර යන යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත් වීමෙහි යම් දෝෂයක් හේතුකොට ගෙන මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස නො සැලකිය යුතු බව.

**9.** මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත් වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් මණ්ඩලයේ කිසි ම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතුය.

සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

**10.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් හා ප්‍රමාණෙ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, එසේ ම නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතුය.

මණ්ඩලයේ සභාපති.

**11.** (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් සභාපතිවරයකු පත් කළ යුතුය.

(2) මණ්ඩලයේ සභාපති එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය ඔහු විසින් දැරිය යුතුය. යම් රැස්වීමකට ඔහු නො පැමිණි විටෙක ඒ රැස්වීමට පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් කෙනකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා ගත යුතුය.

(3) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ මණ්ඩලයේ සභාපති සිය ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් ව සිටින හොත් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට මණ්ඩලයේ වෙන යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(4) අමාත්‍යවරයා විසින්, යම් හේතුවක් නො දක්වා, සභාපතිගේ පත්වීම අවසන් කළ හැකිය. සභාපතිගේ පත් වීම අවසන් කිරීම අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න නො කළ යුතුය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක මූලසුන දරන්නා හට ස්වකීය ඡන්දයට අතිරේක වශයෙන් තීරණ ඡන්දයක් තිබිය යුතුය.

(6) සභාපතිවරයාට අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් අස් විය හැකිය.

(7) (4) වන උපවගන්තියෙහි සහ (6) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, සභාපතිගේ ධුර කාලය, මණ්ඩලයෙහි ඔහුගේ සාමාජිකත්වයෙහි කාලය විය යුතුය.

මණ්ඩලයේ රැස්වීම්.

**12.** මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව ද, ඒ රැස්වීම්වල දී කරනු ලබන කටයුතු පිළිබඳව ද වූ ස්වකීය ක්‍රියා පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කළ හැකිය.

මණ්ඩලයේ මුද්‍රාව.

**13.** (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය භාරයෙහි තිබිය යුතුය.

(2) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් මණ්ඩලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර මණ්ඩලයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට නො තැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා මා ඒ සාධන පත්‍රය අත්සන් කළ යුතුය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව. 19 අධි.

**14.** මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතුය.

15. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් විය යුතු බව. 26 අධි.

## II වන කොටස

### මණ්ඩලයේ පරමාර්ථ, බලතල සහ කටයුතු

16. (1) මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික විය හැකි සියලු ක්‍රියා කිරීමටත් සියලු පියවර ගැනීමටත් මණ්ඩලයට බලය ඇත්තේ ය.

මණ්ඩලයේ බලතල සහ කටයුතු.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව මණ්ඩලය විසින් පහත සඳහන් බලතල සියල්ල හෝ ඉන් යමක් ක්‍රියාවෙහි යෙදවිය හැකි ය :—

(අ) පලතුරු වගා කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි යම් ඉඩමක ප්‍රමාණය සහ පිහිටීම විධිමත් කිරීම සහ පාලනය කිරීම ;

(ආ) වගා කිරීමේ ව්‍යවහාර ක්‍රම විධිමත් කිරීම හා පාලනය කිරීම සහ විවිධ පලතුරු ජාති වර්ග කිරීම ;

(ඇ) යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදන සෑදීම, සකස් කිරීම හෝ ටින්වල ඇහිරීම සඳහා පිහිටුවන හෝ පිහිටුවා තිබෙන යම් කර්මාන්ත ශාලාවක පැවතිය යුතු කාර්මික ප්‍රමිති විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එකී යම් කර්මාන්ත ශාලාවක නිෂ්පාදන සඳහා තත්ව ප්‍රමිති නියම කිරීම ;

(ඈ) සෑදීමේ, සකස් කිරීමේ හෝ ටින්වල ඇහිරීමේ කර්මාන්ත ශාලාවල දී පලතුරු සෑදීමේ, සකස් කිරීමේ හෝ ටින්වල ඇහිරීමේ ක්‍රම විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එකී යම් කර්මාන්ත ශාලාවක පිහිටීම විධිමත් කිරීම හා පාලනය කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත ද පලතුරු හෝ පලතුරු නිෂ්පාදන අලෙවි කිරීම, බෙදා හැරීම හා විකිණීම පාලනය කිරීම හා මෙහෙයවීම ;

(ඊ) යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදන වගා කිරීමේ, අලෙවි කිරීමේ හෝ සකස් කිරීමේ නියුක්ත, යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියකට, රජයේ අනුග්‍රහය ලබන සංස්ථාවකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ (සංස්ථාගත වූ හෝ නො වූ) යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට මුදලින් හෝ අන් ලෙසකින් ආධාර දීම ;

(උ) ශ්‍රී ලංකාවේ පලතුරු හා පලතුරු නිෂ්පාදන අපනයනය කිරීම සඳහා විදේශීය වෙළෙඳ පොළවල් ඇති කිරීම සහ වැඩි දියුණු කිරීම හා ඒ පලතුරු නිෂ්පාදන විදේශයන්හි ප්‍රචාරය කිරීම ;

(ඖ) අපනයනය කිරීමේ කාර්යයන් සඳහා වින්වල ඇහුරු පලතුරු හා පලතුරු නිෂ්පාදන සෑදීම සහ ශ්‍රී ලංකාව තුළ මෙන් ම ඉන් පිටත ද එකී යම් කාර්යයන් සඳහා වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීම ;

(එ) මණ්ඩලය විසින් පලතුරු වගා කිරීමට සම්බන්ධ සියලු කටයුතු සහ ඒ පලතුරු සකස් කිරීම සහ වින්වල ඇහිරීම සඳහා කර්මාන්තශාලා පිහිටුවීම ; සහ

(ඒ) ස්වකීය අංශ, නියෝජ්‍යතන්ව, රසායනාගාර, පරීක්ෂණ හා පර්යේෂණ ස්ථාන ද, ගොවිපළවල් ද පිහිටුවීම.

මණ්ඩලය විසින් විධාන කළ හැකි බව.

17. (1) කර්මාන්ත ශාලා හිමියාට අවශ්‍ය පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් අතුරින් යමක් හෝ සියල්ල මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබිය හැකි මාර්ගයකින් මිළ දී ගන්නා ලෙස යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදන සෑදීම, සකස් කිරීම හෝ වින්වල ඇහිරීම සඳහා ඉදි කෙරෙන යම් කර්මාන්ත ශාලාවක හිමියකුට හෝ අලුත් වැඩියා කෙරෙන කර්මාන්ත ශාලාවක හිමියකුට හෝ මණ්ඩලය විසින් විධාන කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

පිරියතක් හෝ කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට මණ්ඩලය විසින් බලය දීම.

18. (1) මණ්ඩලයේ පූර්ව අනුමතිය ඇතිව හැර යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදනයක් සෑදීම, සකස් කිරීම හෝ වින්වල ඇහිරීම සඳහා වූ කිසි ම පිරියතක් හෝ කර්මාන්ත ශාලාවක් ශ්‍රී ලංකාව තුළ නො පිහිටුවිය යුතුය.

(2) යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදනයක් සෑදීම, සකස් කිරීම හෝ වින්වල ඇහිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි යම් පිරියතක් හෝ කර්මාන්ත ශාලාවක් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියට අනුව ද එසේ නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් ද ලියාපදිංචි කිරීම හා බල පත්‍ර දෙනු ලැබීම සඳහා මණ්ඩලය විසින් විධිවිධාන සැලැස්විය හැකිය.

පරීක්ෂා කිරීමට මණ්ඩලය සතු බලතල

19. (1) (අ) යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදනයක් සෑදීම, සකස් කිරීම හෝ වින්වල ඇහිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගත හැකි යම් පිරියතකට, කර්මාන්ත ශාලාවකට හෝ ස්ථානයකට ; හෝ

(ආ) යම් පලතුරු වගා කරනු ලබන හෝ වගා කිරීම සඳහා පිළියෙල කරනු ලබන යම් පලතුරු වත්තකට හෝ ගොවිපළකට

යම් යුක්ති සහගත වේලාවක ඇතුළු වී එය පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට සාමාන්‍යයෙන් හෝ නිශ්චිත ව හෝ ලියවිල්ලකින් බලය දිය හැකි ය.

(2) එසේ බලය පවරනු ලැබූ මණ්ඩලයේ එකී සාමාජිකයකුට ඇති බලතල (1) වන උපවගන්තිය යටතේ ක්‍රියාවේ යෙදවීමේ දී යුක්ති සහගත හේතුවක් නොමැති ව ඔහු වළකන හෝ ඔහුට බාධා කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.

20. (1) නියමිත ව සඳහන් කාලසීමාවක් තුළ පහත දැක්වෙන තොරතුරු සියල්ල හෝ ඉන් යමක් සපයන ලෙස පලතුරු හෝ යම් පලතුරු නිෂ්පාදන, වවන්නකුගෙන්, රැස් කරන්නකුගෙන්, වෙළෙන්දකුගෙන්, සාදන්නකුගෙන්, සකස්කරන්නකුගෙන්, පින් වල අසුරන්නකුගෙන්, තොග වෙළෙන්දකුගෙන් හෝ සිල්ලර වෙළෙන්දකුගෙන් මණ්ඩලය විසින් යම් කිසි අවස්ථාවක දී ලියවිල්ලකින් ඉල්විය හැකිය :— මණ්ඩලය විසින් තොරතුරු ඉල්විය හැකි බව.

(අ) වවනු ලබන පලතුරු වර්ගවලට, ඒ වැවීම සඳහා යොදා ගනු ලබන ඉඩමේ ප්‍රමාණයට සහ ඒ පලතුරු වැවීමේ, පල නෙලීමේ හෝ වර්ග කිරීමේ ක්‍රමවලට සම්බන්ධ යම් තොරතුරක් ;

(ආ) පලතුරු ප්‍රවාහනය කිරීමට හෝ ඒ ප්‍රවාහනය සඳහා අය කරනු ලබන හෝ අය කරනු ලැබිය හැකි ගාස්තු හෝ අය කිරීම් ප්‍රමාණවලට සම්බන්ධ යම් තොරතුරක් ;

(ඇ) යම් පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් සාදන, සකස් කරන හෝ පින්වල අසුරන පිරියතක හෝ කර්මාන්ත ශාලාවක ප්‍රයෝජනයට ගනු ලබන යන්ත්‍රවලට සම්බන්ධ යම් තොරතුරක් හෝ ඒ පිරියතෙහි හෝ කර්මාන්ත ශාලාවෙහි මෙහෙයුම් පිරිවැයට, මුදල්වලට, වෙළෙඳාමට හෝ කම්කරු සේවා නියුක්තියට සම්බන්ධ යම් තොරතුරක් ; සහ

(ඈ) යම් පලතුරු නිෂ්පාදනයක් මිල දී ගැනීමට, විකිණීමට, අලෙවි කිරීමට, ගබඩා කිරීමට, ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට නොහොත් ඒ පලතුරු නිෂ්පාදනය සෑදීමේ දී ප්‍රයෝජනයට ගනු ලබන යම් අමු ද්‍රව්‍ය පාවිච්චි කිරීමට සම්බන්ධ යම් තොරතුරක්.

(2) මේ වගන්තිය යටතේ සපයනු ලබන යම් තොරතුරක් ලියවිල්ලකින් දිය යුතු අතර, ප්‍රකාශකයාගේ හොඳ ම දැනීමේ හා විශ්වාසයේ ප්‍රමාණයට ඒ තොරතුර සත්‍ය හා නිවැරදි බවට වූ ප්‍රකාශයක් ද ඒ සමඟ තිබිය යුතුය.

(3) යුක්ති සහගත හේතුවක් නොමැතිව (1) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ තමා සපයන තොරතුරු අසත්‍ය බව දැන දැන ම (2) වන උපවගන්තිය යටතේ තොරතුරු සපයන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද සියලු තොරතුරු, ඒ තොරතුරු දුන් තැනැත්තාගේ ලිඛිත එකඟත්වය ඇතිව එකී යම් තොරතුරක් අනාවරණය කරනු ලබන හෝ ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවක දී හැර, මණ්ඩලයේ සාමාජික යන් විසින් ද එහි සෑම නිලධරයකු හා සේවකයකු විසින් ද රහස්‍ය ලෙස සැලකිය යුතුය:

එසේ වුව ද මේ පනතේ හෝ මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක කාර්යයන් සඳහා, නැතහොත් යම් නියමිත පුද්ගලයකු හෝ ව්‍යාපාරයක් සඳහන් නො කෙරෙන කරුණු හා සංඛ්‍යා පිළිබඳ සංඛ්‍යා ලේඛනමය කාර්යයන් සඳහා එකී යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම මේ උපවගන්තියෙහි වූ කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැලකිය යුතුය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේය.

මණ්ඩලය විසින් නියෝජ්‍යත්ව ආදිය පිහිටුවීම.

21. මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීම, යුතුකම් ඉටු කිරීම සහ කාර්ය කිරීම සඳහා අවශ්‍ය විය හැකි අංශ හා නියෝජ්‍යත්ව පිහිටුවීම ද එසේ අවශ්‍ය විය හැකි රසායනාගාර ද පරීක්ෂණ හා පර්යේෂණ ස්ථාන ද ගොවිපළවල් ද පිහිටුවීම, පවත්වාගෙන යාම හා ක්‍රියා කරවීම මණ්ඩලය විසින් කළ හැකිය.

පලතුරු සෙස් බද්ද.

22. (1) වෙන යම් ලිඛිත නීතියක් යටතේ පනවා ඇති යම් බද්දකට හෝ අපනයන තීරු බද්දකට අතිරේක වශයෙන්, යම් පලතුරු හෝ පලතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පලතුරු සෙස් බද්ද යයි කියනු ලබන සෙස් බද්දක්, අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන ආකාරයෙන් හා ප්‍රමාණයෙන් යුක්තව, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියමයක් මගින් පැනවීම හෝ අය කිරීම හෝ කළ හැකිය.

235 අධි.

(2) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් මෙන් බල සහිත විය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන අපනයන ස්ථානයේ දී සෙස් බද්ද අය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) පලතුරු සෙස් බද්දෙන් ලැබෙන මුදල් මණ්ඩලයට ගෙවිය යුතුය.

(4) සෙස් බද්ද බලාත්මක ලෙස පනවා අය කිරීම සඳහා අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

තත්ත්ව සහතිකය.

23. (1) මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන තත්ත්ව සහතික යක් පිට හැර කිසිම පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන දිනයක දී හෝ ඉන් පසුව, ශ්‍රී ලංකාවෙන් අපනයනය නො කළ යුතුය.

(2) එකී නිෂ්පාදනයක් සඳහා මණ්ඩලය විසින් නියම කරනු ලබන තත්ත්ව ප්‍රමිතියකට ඒ නිෂ්පාදනය අනුකූල නම් මිස, මණ්ඩලය විසින් (1) වන උපවගන්තියෙහි නියමයන් අනුව තත්ත්ව සහතිකයක් නිකුත් නො කළ යුතුය.

(3) යම් පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් සම්බන්ධයෙන් තත්ත්ව සහතිකයක් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන අවස්ථාවක, පවත්වා ගත යුතු යයි මණ්ඩලය විසින් නියමිත තත්ත්ව ප්‍රමිතියකට ඒ නිෂ්පාදනය අනුකූල බවට ඒ සහතිකය ඇපවීමක් විය යුතු අතර, ඒ සහතිකය ඒ නිෂ්පාදනයේ තත්ත්වය පිළිබඳව මණ්ඩලය සෑහීමට පත් වීමේ තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(4) (අ) තත්ත්ව සහතිකයක් නිකුත් කිරීමේ ආකෘතිය හා ආකාරය සහ යම් පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් පිළිබඳ පවත්වා ගැනීමට නියමිත තත්ත්ව ප්‍රමිතිය, නියම කරමින් ද

(ආ) මේ වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත හෝ අවශ්‍ය යම් කරුණක් පිළිබඳව ද

නියෝග සෑදිය හැකිය.

## III වන කොටස

### මණ්ඩලයේ අරමුදල සහ කාර්ය මණ්ඩලය

24. (1) මණ්ඩලයට මණ්ඩලයේ ම අරමුදලක් තිබිය යුතු අතර— මණ්ඩලයේ අරමුදල.

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා කලින් කල ජාතික රාජ්‍ය සභාව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) පලතුරු සෙස් බද්දෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී, යුතුකම් ඉටු කිරීමේ දී සහ කාර්ය කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල්

මණ්ඩලයේ අරමුදලට බැර කළ යුතුය.

(2) මේ පනත යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී, යුතුකම් ඉටු කිරීමේ දී සහ කාර්ය කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතුය.

(3) මණ්ඩලයේ ව්‍යාපාර කටයුතුවල කාර්යයන් සඳහා වහා අවශ්‍ය නො වන මණ්ඩලයේ යම් මුදලක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතිය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් මණ්ඩලය විසින් ආයෝජනය කළ හැකිය.

25. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මණ්ඩලයේ මුදල් පාලනය සහ ගණන් හිලව් කෙරෙහි අදාළ වන්නේය. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

මණ්ඩලයේ මුදල් වර්ෂය.

26. මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

27. (1) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම සහ කාර්ය මණ්ඩලයේ විනය පාලනය කිරීම මණ්ඩලය විසින් කළ හැකිය.

(2) මණ්ඩලය විසින්, අමාත්‍යවරයා විමසා—

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කළ හැකිය;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ සේවයෙහි නියමයන් හා කොන්දේසි නිශ්චය කළ හැකිය; තව ද

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කොට එකී යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවිය හැකිය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

28. (1) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කළ හැකි කාල සීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය; නැතහොත් රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හා එකී ලේකම්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(2) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

නියෝග.

29. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේ හා බල ගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පවරන ලද බල තලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය :—

(අ) නියම් කරන ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කරුණක් ;

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ද යම් සහතික යක් නිකුත් කිරීම සඳහා ද ගාස්තුව නියම කිරීම ;

(ඇ) 20 වන වගන්තිය යටතේ යම් තොරතුරක් මණ්ඩලයට සැපයීම ;

(ඈ) යම් පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් සෑදීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ පින්වල ඇසිරීම සඳහා ප්‍රයෝජන යට ගනු ලබන යම් පිරියතක් හෝ කර්මාන්ත ශාලාවක් පරීක්ෂා කිරීම, අනුපාලනය කිරීම, විධිමත් කිරීම සහ පාලනය කිරීම ;

(ඉ) යම් පලතුරක් හෝ පලතුරු නිෂ්පාදනයක් සෑදීම, සකස් කිරීම හෝ පින්වල ඇසිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරනු ලබන යම් පිරිය තක හෝ කර්මාන්ත ශාලාවක හිමියා විසින් යම් පිරියතක්, යන්ත්‍ර හෝ සවි කිරීම් මිල දී ගැනීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

(4) සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ජාතික රාජ්‍ය සභාව විසින් එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතුය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතුය.

(5) මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.

**30.** (1) යම් නිශ්චල දේපළක් මණ්ඩලයේ යම් කාර්යයක් සඳහා අත්කර ගැනීම අවශ්‍ය වූ විට යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන් නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ දේපළ අත්කර ගෙන මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකිය.

ඉඩම අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය විසින් නිශ්චල දේපළ අත්කර ගැනීම.
460 අධි.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය සඳහා යම් දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් මණ්ඩලය විසින් ගෙවිය යුතුය.

මණ්ඩලයට රාජ්‍ය දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදු දීම. 454 අධි.

31. රාජ්‍යය සතු යම් නිශ්චල දේපළක් මණ්ඩලයේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කළ යුතු හෝ බදු දිය යුතු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, මණ්ඩලය වෙත ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීමකට හෝ බදු දීමකට අදාළ විය යුතුය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

32. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව

කිසි ම සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නො හැකි විය යුතුය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධ ව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එබඳු යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවනු ලබන හෝ මණ්ඩලය විසින් අය කර ගනු ලබන යම් ගාස්තුවක් මණ්ඩලයේ අරමුදලට බැර කළ යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධ ව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගනිතහොත් ඒ සිවිල් නඩුවෙහි දී හෝ අපරාධ නඩුවෙහි දී එකී වියදම ඔහු විසින් අය කර ගන්නා ලද්දේ නම් මිස, මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු ය.

දුෂ්කරතා ලිහිල් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

33. මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවලින් හෝ නියමිත යම් උපචාරයක් යම් තැනැත්තකුට අචේතනාන්විතව පිළිපැදිය නො හැකි වීමේ හේතුවෙන් ඒ තැනැත්තාට සැලකිය යුතු දුෂ්කරතාවක් සිදු විය හැකි අවස්ථාවක් අමාත්‍යවරයාගේ මතය පරිදි මේ පනත ක්‍රියාත්මක වීමේ දී පැන නැගුණහොත්, ඒ දුෂ්කරතාව ලිහිල් කිරීම හෝ වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි විධාන අමාත්‍යවරයා විසින් කළ හැකිය.

34. මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට නො වැඩි කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දහසකට නො වැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම යටත් විය යුතුය. වැරදි.

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි — අර්ථ නිරූපණය.

"අලෙවි කිරීම" යන්නට පලතුරු හෝ යම් පලතුරු නිෂ්පාදනයක් ඇහිරීම සහ වර්ග කිරීම ද ඇතුළත් වේ;

"කර්මාන්ත ශාලාව" යන්නෙන් අතින් හෝ යාන්ත්‍රික හෝ රසායනික මාර්ගයකින් අලුත් පලතුරු යම් පලතුරු නිෂ්පාදනයක් බවට පරිවර්තනය කිරීම කර ගෙන යන යම් ස්ථානයක් අදහස් කෙරෙන නමුදු හුදු ගෘහ්‍ය හෝ පෞද්ගලික පාරිභෝජනය සඳහා ඒ පරිවර්තනය කෙරෙන යම් ස්ථානයක් එයට ඇතුළත් නො වේ;

"පලතුරු" යන්න, මේ පනතේ කාර්යයන් සඳහා යෙදුණු විට, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියමිත යම් පලතුරක් ඉන් අදහස් වේ; තවද

"පලතුරු නිෂ්පාදනය" යන්නෙන් අතින් හෝ යාන්ත්‍රික හෝ රසායනික මාර්ගයකින් පලතුරුවලින් ලබා ගන්නා ලද යම් නිෂ්පාදනයක් හෝ එබඳු යම් නිෂ්පාදනයකින් ලබා ගන්නා ලද යම් අතුරු නිෂ්පාදනයක් අදහස් වේ.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.